# ගංවතුර - සතුන් හා කෘමීන් ආශ්‍රිත උවදුරු

## ගංවතුරකින් පසුව සතුන් හා කෘමීන් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ තොරතුරු

**Sinhalese | සිංහල**

**OFFICIAL**

ගංවතුරෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශයකට නැවත පැමිණෙන විට, මීයන්, සර්පයන් හෝ මකුළුවන් ඇතුළු වන සතුන් ඔබේ නිවසේ, මඩුවේ හෝ ගෙවත්තේ කොටු වී සිටිය හැකිය.

### සර්පයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

- එළිමහනේ සිටින විට:
  - ✓ ශක්තිමත් සපත්තු, අත්වැසුම් හා ඔබේ කකුල් ආරක්ෂා කර ගැනීම සඳහා දිගු කලිසම් පළඳින්න
  - ✓ ගංවතුරෙන් පසු පිරිසිදු කිරීමේදී ඔබේ අත් සහ පාද කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න
  - ✓ ඔබ සර්පයෙකු දුටුවහොත්, පසුපසට ගොස් එම සර්පයාට ඉවතට යාමට ඉඩ දෙන්න - සර්පයා ස්පර්ෂ නොකරන්න.
  - ✓ ජලයේ පිහිනන සර්පයන් ගැන අවධානයෙන් සිටින්න
  - ✓ ඔබේ නිවස අවට ඇති අපද්‍රව්‍ය වලට සර්පයන්, මකුළුවන් සහ මීයන් ආකර්ෂණය කර ගත හැකි බැවින්, ඔබ විසින් ඒවා ඉවත් කළ යුතුය.

- ඔබේ නිවසේ දී සර්පයෙකු හමු වුවහොත්, කලබල නොවන්න, සෙමින් පසුපසට ගොස් එම සර්පයාට ඉවත් වී යෑමට ඉඩ දෙන්න. සර්පයා ස්පර්ෂ නොකරන්න. ඔබේ ප්‍රදේශයේ සිටින සර්පයන් අල්ලන්නන්ගේ ලැයිස්තුවක් ලබා ගැනීම සඳහා 136 186 ඔස්සේ පරිසර, ඉඩම්, ජලය සහ සැලසුම් දෙපාර්තමේන්තුව අමතන්න.
- සර්පයෙකු ඔබට දෂ්ඨ කළහොත්:
  - ✓ හැපුම් තුවාලය වටා සම සේදීමෙන් වලකින්න
  - ✓ නිශ්චලව සිටිමින් 000 අමතා හදිසි වෛද්‍ය උපකාර ලබා ගන්න
  - ✓ හැපුම් තුවාලය ඔබේ හදවතේ මට්ටමට පහළින් සිටින සේ වැතිර සිටින්න, නැතිනම් වාඩි වී සිටින්න.
  - ✓ පිරිසිදු හා වියළි වෙළුම් පටියකින් ප්‍රදේශය ආවරණය කරන්න. හැකි නම්, දෂ්ඨ කිරීම සිදු වූ ප්‍රදේශය වටා තද වෙළුම් පටියක් යෙදීම ද නිර්දේශ කරනු ලැබේ.
  - ✓ දෂ්ඨ කළ වේලාව සහ වෙළුම් පටිය යෙදූ අවස්ථාව සටහන් කර තබන්න
  - ✓ ලේ ගැලීම වැළැක්වීමේ තිරිංගයක් යෙදීමෙන්, විෂ මුදා හැරීම සඳහා හැපුම් තුවාලය කැපීමෙන් හෝ තුවාලයෙන් විෂ උරා බීමට උත්සාහ කිරීමෙන් වැළකී සිටින්න.

### මකුළුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

- මකුළුවෙකු ඔබට දෂ්ඨ කළහොත්:
  - ✓ වේදනාව සමනය කර ගැනීමට දෂ්ඨ කළ ප්‍රදේශය සෝදා අයිස් පොට්ටනියක් තබන්න
  - ✓ පීඩනය යෙදීමෙන් වළකින්න

- ✓ රතු මකුළුවෙකු (redback spider) විසින් ඔබව  දෂ්ඨ කළහොත් හෝ ඔබේ රෝග ලක්ෂණ නරක අතට හැරුනොත්, වහාම වෛද්‍ය උපකාර ලබා ගන්න.

## මීයන් සහ කෘමීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

- කොස් ඇට මීයන් සහ මීයන් වැනි මූෂිකයෝ රෝග පතුරවති. මීයන්ට රැකවරණය සැපයිය හැකි ආහාර සහ අනෙකුත් දේවල් ඔබ විසින් ඉවත් කළ යුතුය.
- කුණු කසල ඉවත් කර කසල බඳුන මත පියනක් තබන්න.  අවශ්‍ය නම්, වියළි ප්‍රදේශවල මී උගුල් අටවන්න.
- එක තැන පල්වෙන ජලයෙන් මදුරුවන් බෝවන බැවින් ඒවා ඉවත් කරන්න.  ඔබේ ශරීරය හැකිතාක් ආවරණය කරගෙන මදුරු විකර්ෂකයක් භාවිතා කරන්න.
- මැස්සෝ රෝග පතුරවති. ආහාර අපද්‍රව්‍ය මඟින් මැස්සන් බෝ කරන බැවින් වහාම ඒවා පිරිසිදු කරන්න.
- සතෙකු විසින් දෂ්ඨ කළහොත් හෝ තුවාල කළහොත් හෝ කෘමියෙකු විසින් දෂ්ඨ කළහොත් ඔබේ වෛද්‍යවරයාගෙන් උපදෙස් ලබාගන්න, නැතහොත් 1300 60 60 24 ඔස්සේ සතියේ සෑම දිනක ම දවසේ පැය 24 පුරා NURSE-ON-CALL අමතන්න.

මෙම ප්‍රකාශනය ප්‍රවේශ විය හැකි ආකෘතියකින් ලබා ගැනීමට, pph.communications@health.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යොමු කරන්න.